**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6 ඡේදයේ 1.6.1(ඇ),(ඇ) හා 1.6.2 (ආ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැඩ නිම කළ රු.870,000ක් වූ වටිනාකමැති කර්මාන්ත 02ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ආදායමින් ප්‍රාග්ධන දායක ගිණුමට එරෙහිව වත්කම් ගිණුම්වලට ගැළපීමට කටයුතු කරන බව. | ගිණුම්වල අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාලව වැට් බදු වෙන් නොකිරීම හේතුවෙන් ණය හිමියෝ රු.1,201,300ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ජනල් සටහන් මගින් ගිණුම්වලට ගලපා ණයහිමියන් නිවැරදි කරන බව. | එම |
| (ඇ) | 2021 වර්ෂයේදී වටිනාකමක් සඳහන් නොකළ ඉඩම් 05ක්ද ප්‍රදාන වශයෙන් ලැබී තිබූ ඉඩම් කොටස් 02ක්ද තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි සභාවේ ඉඩම් පිළිබඳ නැවත තක්සේරු කිරීමට කටයුතු කරමින් පවතින අතර, ඒ අනුව 2023 වර්ෂයේදී ගිණුම් වලට ගැලපීමට කටයුතු කරන බව. | එම |
| (ඈ) | 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශනවල විලම්භිත අයවිය යුතු ශේෂ ලෙස දක්වා තිබූ රු.27,175,869ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂ ගණනාවක සිට පැවත එන ගිණුම්කරණ දෝෂ නිවැරදිව හඳුනා ගෙන 2023 මූල්‍ය ප්‍රකාශන වලින් නිරවුල් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ගිණුම් දෝෂ හා වැරදි හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ඇප ගිණුමේ ශේෂය රු.535,618 ක් වූ අතර උප ලේඛණ අනුව ශේෂය රු. 587,151ක් වූයෙන් රු. 51,533ක වෙනසක් විය. | 2023 වර්ෂයේදී එය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | උපලේඛන ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 2016 වර්ෂයේ සිට පැවත එන රු.27,367,484 ක කර්මාන්ත ණයහිමියන් නිරවුල් කර නොතිබුණි. | ගෙවීම් කිරීමට හැකි කර්මාන්ත සඳහා ගෙවීම් කිරීමට හෝ සභාවේ ආදායමට ගැනීමට කටයුතු කරන බව. | ණයහිමියන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු. 424,581,241 ක් වූ අතර වසර 5 ක් ඉක්ම වූ රු.2,534,458 ක ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම හිඟ මුදල් හැකිතාක් අයකිරීමට කටයුතු කරන අතර තවදුරටත් අක්‍රිය ඒකක සඳහා නීතිමය පියවර ගැනීමට හා සාධාරණ හේතු සහිතව පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 අධිකාරී බලය නොලත් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු පෙර පාසල් 15කට අයත් ළමුන්ගෙන් 2022 දෙසැම්බර් මාසය වන විට සභාවේ නම් සඳහන් කුවිතාන්සි මගින් අයකර බැංකු ගිණුම්වල තැන්පත් කර තිබුණු මුදල රු.6,190,489 ක් විය. මෙලෙස අයකර තිබූ මුදල් විවිධ අවස්ථාවන් වලදී සභා අනුමැතියකින් තොරව වියදම් කර තිබුණු අතර කිසිදු විගණනයකටද ලක්වී නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් රු.14,894,945ක මුදලක්ද පෙර පාසල් සඳහා වැය කර තිබුණි. | පෙර පාසල් 15 ට අදාල ගිණුම්වල ගණුදෙනු නියාමනය කිරීම සඳහා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බව. | සියළු ආදායම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | රු.3,874,591ක කල් ඉකුත් වූ තැන්පතු නියාදනය කර නොතිබුණි. | තැන්පත් නිදහස් කිරීමට හෝ සභාවේ ආදායමට ගැනීමට කටයුතු කරන බව. | තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ, පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.96,054,678ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වූ වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.94,011,251ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 19,610 | 20,037 | 16,005 | 9,531 | 18,595 | 16,930 | 14,338 | 7,352 |
| කුලී | 36,642 | 31,134 | 28,698 | 3,987 | 39,471 | 25,947 | 25,403 | 5,251 |
| බලපත්‍ර ගාස්තු | 4,290 | 3,817 | 3,817 | 264 | 4,135 | 3,519 | 3,519 | 508 |
| වෙනත් ආදායම් | 17,823 | 17,703 | 8,782 | 7,360 | 335,078 | 220,684 | 165,839 | 54,845 |
| එකතුව | 78,365 | 72,691 | 57,302 | 21,142 | 397,279 | 267,080 | 209,099 | 67,956 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම්**<br>සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.9,197,839ක් වූ අතර, එම හිඟය තුළ වර්ෂ 01ට වැඩි වර්ෂ 05ට අඩු රු.4,395,260 ක් හා වර්ෂ 05ට වැඩි රු.1,355,579ක් විය. | මෙම හිඟ මුදල් හැකිතාක් අයකිරීමට කටයුතු කරන අතර තවදුරටත් අක්‍රිය ඒකක සඳහා නීතිමය පියවර ගැනීමට හා සාධාරණ හේතු සහිතව පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | හිඟ පනතේ විධිවිධාන අනුව කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) අක්කර බදු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් හිමියන්ගෙන් අයවිය යුතු හිඟ අක්කර බදු මුදල රු.216,643ක් වූ අතර එම හිඟයෙන් රු.157,021ක් අවුරුදු 05කට වැඩි කාලයක සිට අයවීමට තිබුණි. | දේපල හඳුනා ගැනීමේ සමීක්ෂණ කටයුතු කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. | හිඟ අක්කර බදු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ) කුලී**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කුලී රු.3,987,469ක් විය. එයින් වර්ෂ 05කට වැඩි කුලී හිඟය රු.863,564ක් හා වර්ෂ 01ත් 05 අතර රු.1,714,104ක් විය. | අයකර ගැනීමට හෝ අයකල නොහැකි ශේෂ සම්බන්ධව නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව. | හිඟ කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.3 අධිභාර**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තිය ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව පළාත් පාලන කොමසාරිස් (වයඹ)ගේ 2018 පෙබරවාරි 15 දිනැති ව.ප.පා.දෙ. 02/09/01/01ගි.කා.2006 දරන ලිපිය අනුව රු.326,355ක් අයකර ගැනීමට තිබුණි. | අවස්ථා දෙකකදීම වයඹ පළාත් පාලන කොමසාරිස් තුමා වෙතින් හා අදාළ කඩයිම් මඟින් බස්නාහිර පාළාත් ප්‍රධාන ලේකම්තුමා මඟින් මහවිට යක්කල අධ්‍යක්ෂ මානව සම්පත් සංවර්ධන හා කළමනාකරණ පුහුණු ආයතනය වෙත හා අදාළ නිලධාරියාට ද පිටපත් සහිතව දන්වා යවා ඇති බව. | අධිභාර අයකර ගැනීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල,පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලුණුවිල ප්‍රදීපා ක්‍රීඩාංගනයේ ඇවිදින මංතීරුව හා දැල් වැට ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.3,729,962 ක් වැයකර තිබූ නමුත් මේ වන විට මංතීරුවෙහි කටු පඳුරු හා තණ වැවී තිබුණි. | නිසි පරිදි නඩත්තු කර භාවිතයට ගැනීමට කටයුතු කරන බව. | ක්‍රීඩාංගනය යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙන්නප්පුව පැරණි වෙළඳ සංකීර්ණයේ වර්ග අඩි 6878 ක් වූ උඩුමහළ නීත්‍යානුකූලව ටෙන්ඩර් ලබා නොදී, වෙළඳ සමාගම් 03කට ගාස්තු අයකිරීමකින් තොරව භාවිතය සඳහා ලබාදී තිබුණි. | ඉදිරියේදී ප්‍රතිසංස්කරණය කර විධිමත් ටෙන්ඩර් ක්‍රියාවලියක් මඟින් බදු දීමට අපේක්ෂා කරන බව. | විධිමත් ක්‍රමවේදයකට අනුව අදාළ ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වෙන්නප්පුව නව වාණිජ බහුකාර්යය ගොඩනැගිල්ලේ පලමු මහලේ වර්ග අඩි 364ක් වූ අංක 08 කඩ කාමරය 2017 මැයි 17 දින සිට බදු දීමට කටයුතු කර නොතිබීම නිසා සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි. | ඉදිරියේදී එය බදු දීමට අවශ්‍ය කටයුතු කරන බව. | සභා දේපළ බදු දී ආදායම් රැස් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අඩු ආදායම්ලාභී පවුල් 250 ක් සඳහා වියළි ආහාර ද්‍රව්‍ය ලබා දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.500,000ක මුදලක් වැය කර තිබුණු අතර ආධාරලාභීන් අඩු ආදායම්ලාභීන් බවට ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් සහතික කිරීමක් කර ගෙන නොතිබුණි. | අතපසු වූ වැරදි නිවැරදි කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | නිවැරදි තොරතුරු හා අවශ්‍ය තහවුරු කිරීම් ලබාගත යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 05කට වරක් වරිපනම් බදු ප්‍රතිශෝධනය කළ යුතු වුවත් 2012 වර්ෂයේ සිදු කරන ලද තක්සේරුව මත බදු අය කරමින් තිබුණි. | 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිත බව. | යාවත්කාලීන තක්සේරුවකට අනුව ආදායම් අයකර ගත යුතුය. |
| (ආ) | වර්ෂ 05කට වරක් බල ප්‍රදේශයේ සමීක්ෂණයක් සිදුකර අක්කර බදු අයකර ගත හැකි ඉඩම් හඳුනා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරමින් පවතින බව. | අක්කර බදු අයකර ගත හැකි ඉඩම් සමීක්ෂණ මඟින් හඳුනා ගෙන නියමිත පරිදි බදු අය කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල පවරා නොගත් දේපළ 103ක් පැවති අතර ඒ තුල කාර්යාල, පොදු වෙළඳ පොලවල්, පෙර පාසල්, පුස්තකාල, ප්‍රජා ශාලා හා සුසාන භූමි පැවතුණි. | ඉඩම් බොහොමයක මැණුම් කටයුතු සිදු කර ඇති බව දන්වන අතර මෙම ඉඩම් වල සම්පූර්ණ අයිතිය ප්‍රාදේශීය ලේකම් වන බැවින් ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය මත බව. | අදාළ දේපළ පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෘජු ශ්‍රමය පදනම් කොට ගෙන ඉටු කරන ලද නඩත්තු කර්මාන්ත 33ක් ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව ඉටු කර තිබුණු අතර ඇස්තමේන්තු රහිත නඩත්තු කටයුතු වෙනුවෙන් රු.1,241,172ක ද්‍රව්‍ය තොග ලේඛනවලින් ඉවත් කර තිබුණි. | මෙම කර්මාන්ත වලින් මාර්ග 06ක් ABC පමණක් යොදා සකස් කර ඇති අතර, එම කර්මාන්තවල ද්‍රව්‍ය වැයවීම "මාර්ගයන්හි වලවල් සඳහා ABC අතුරා අළුත්වැඩියාව" සඳහා විය. මාර්ග 13 ක ද්‍රව්‍ය වැයවීම් ලේඛණයේ සටහන් කර ඇතත්, එහි සඳහන් නම හා ඇස්තමේන්තුවේ සඳහන් නම අතර වෙනස්කමක් පවතියි. ඉතිරි මෙම මාර්ග 14 සඳහා ඇස්තමේන්තු හා ගෙවීම් වාර්ථා සකස් කර ඇති බව. | ඇස්තමේන්තු සකස් කර කර්මාන්ත ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී මාර්ග 15ක් සඳහා ඇස්තමේන්තු පිළියෙල කර තිබුණද ඒවායේ නඩත්තු කටයුතු සිදු කලාද නැතිද යන්න අනාවරණය කර ගත නොහැකි විය. | මෙම මාර්ග 15 සඳහා ද්‍රව්‍ය වැයවීම් ලේඛණයේ සටහන් කර ඇතත්, එහි සඳහන් නම හා ඇස්තමේන්තුවේ සඳහන් නම අතර වෙනස්කමක් පවතින බව. | නඩත්තු කටයුතු සිදු කළ බවට තහවුරු කර ගත යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේ නඩත්තු අංශයේ ගබඩා ගිණුම් ලෙජරය අනුව චිප්ස් ගල් ලැබීම් ලෙස සටහන් කර තිබුණේ චිප්ස් කියුබ් 74ක් පමණි. ඒ අනුව මිලදීගත් කියුබ් 110ක්ද 2021 වර්ෂයෙන් ඉදිරියට ගෙන කියුබ් 20ක්ද ඇතුළුව කියුබ් 130කින් 74ක් ලේඛනගත කිරීම හේතුවෙන් රු.719,600ක් වටිනාකමැති කියුබ් 56ක් ලේඛනගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ මිලදී ගෙන ඇති සියලු චිප් ගල් කියුබ් ප්‍රමාණ ප්‍රිමික්ස් අංශයේ "මාර්ග නඩත්තු ඒකකය සඳහා ද්‍රව්‍ය වැයවීම්" ලේඛනයට ඇතුලත් කර ඇත. නමුත් ගබඩා ලෙජරයට ඇතුලත් කර ඇති දිනයට පෙර ප්‍රිමික්ස් අංගනය වෙත චිප් ගල් ලැබි තිබු නිසාත් එම දිනයන්වල දිනපතා මාර්ග නඩත්තු කටයුතු සිදු කල නිසාත් එම ද්‍රව්‍ය භාවිතා කිරිමට සිදු වූ බව. | ලැබීම් හා නිකුත් කිරීම් නිසි පරිදි ලේඛනගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2021 වර්ෂයෙන් ඉදිරියට ගෙනා කෝලාස් බැරල් ශේෂය 15ක් වන අතර වර්ෂය තුළ මිලදී ගත් ප්‍රමාණය 150 ක් වේ. ඒ අනුව සම්පූර්ණ ප්‍රමාණය 165කි. එහෙත් ලේඛනයට ඇතුළත් කර ඇත්තේ බැරල් 90 ක් බැවින් රු.2,088,750 ක වටිනාකමැති බැරල් 75 ක තොගයක් ගබඩා ලේඛන අනුව ලැබී නොතිබුණි. | ගබඩාවට ඇතුලත් කර ඇති දිනයට පෙර ප්‍රිමික්ස් අංගනය වෙත C.R.S.I බැරල් ලැබි තිබු බැවින්, තවද එම දිනයන්වල දිනපතා මාර්ග නඩත්තු කටයුතු සිදු කල බැවින් එම ද්‍රව්‍ය භාවිතා කිරිමට සිදුවු නිසා ප්‍රිමික්ස් අංශයේ "මාර්ග නඩත්තු ඒකකය සඳහා ද්‍රව්‍ය වැයවීම්" ලේඛනයට ප්‍රිමික්ස් අංගනය වෙත C.R.S.I බැරල් ලැබුණු දිනයේම ඇතුලත් කර ඇති බව. | ලැබීම් අදාළ දිනයේදී ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | නැගෙනහිර කහටවිල අංක 02 මහයායවත්ත, ජනපදයේ මැද ප්‍රජාශාලාවක් ඉදිකිරීම සඳහා අත්තිවාරමක් දැමීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු.449,975ක් ගෙවා තිබුණි. වසර එක හමාරක පමණ කාලයක් තිස්සේ බාහිර පරිසරයට නිරාවරණය වී තිබූ කම්බි දැඩි මළ බැඳීමකට ලක් වී තිබුණි. | මෙහි ඉදිරි කටයුතු මුදල් ප්‍රතිපාදන නොමැති වීම නිසා නතර වී ඇති බව. | ප්‍රජාශාලාවේ ඉදිකිරීමේ කටයුතු කඩිනමින් ඉටු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) සෙන්දිරියාමුල්ල කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.23,092,195ක මුදලකට ගිවිසුම්ගත වී තිබූ නමුත් වැඩ නිම කර නොතිබුණි. 2022 සැප්තැම්බර් 30 දින වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 31.75ක් වූ අතර ඉටු කරන ලද වැඩවල වටිනාකම රු.8,639,214ක් විය. කොන්ත්‍රාත්කරු වෙත 2022 ඔක්තෝබර් 28 දින වන විට රු.5,381,285ක් ගෙවා ඇති අතර මෙම ව්‍යාපෘතියෙහි වැඩ නතර වී ඇති බව 2022 ඔක්තෝබර් 28 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | සෙන්දිරියාමුල්ල නව කොම්පෝස්ට් අංගණය ඉදි කිරීම මේ වන විට අවසන් අදියරේ පවතින බැවින්, මෙම වර්ෂය තුලදී ගොඩනැගිල්ල භාවිතට ගතහැකි වන බව. | ඉදිකිරීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතු අතර ඉඩම සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ කාර්මික නිලධාරි (විශේෂ) තනතුර අවුරුදු ගණනාවක සිට පුරප්පාඩුව පැවති අතර ද්විතියික තනතුරු 03ක්ද ප්‍රාථමික තනතුරු 08ක්ද පුරප්පාඩු වී තිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුවට ලිඛිතව දැනුවත් කර ඉල්ලීම් කර ඇති බව. | පුරප්පාඩු විධිමත් ලෙස සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.7 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ට්‍රැක්ටර් රථ දෙකක් විධිමත් තක්සේරුවක් යටතේ අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | තක්සේරු වාර්තාව ලැබුණු පසු උක්ත සඳහන් ට්‍රැක්ටර් රථ දෙක අපහරණය කිරීමට කටයුතු කරන බව. | තක්සේරු වාර්තාව කඩිනමින් ලබා ගෙන අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරි සැළැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 10ක් ඉටු කිරීම සඳහා රු.1,302,945ක මුදලක් වැය කර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම් අත්පත් කරගෙන නොතිබුණි. | එහිදී, දේශපාලනික, ආර්ථික හා සාමාජීමය කරුණුද ඉන්ධන, කොරෝනා ගැටළු තත්ත්වයන්ද මේ අතර බෙහෙවින් මුහුණ පෑමට සිදුවූ බව. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව කටයුතු කළ යුතුය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ. 133(1) අනුව අභ්‍යන්තර විගණනය ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම හා කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා සහාය වන ක්‍රියාවලියක් වේ. නමුත් ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණනය විසින් ප්‍රාග්ධන වැය පිළිබඳව විගණනය කර නොතිබූ අතර පැමිණීමේ ලේඛණය, දත්ත පද්ධතිය හා බැංකුවේ මුදල් තැන්පත් කිරීම් පමණක් ආවරණය කර තිබුණි. | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | සියළුම අංශ ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය ශීර්ෂ 28කට අදාළව රු.5,500,000ක වටිනාකමක් අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදනය කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ එම සම්පූර්ණ ප්‍රතිපාදනයම අයවැයගත කාර්යයන් ළඟා කර ගැනීම සඳහා කිසිදු අයුරකින් භාවිත කර නොතිබුණි. | පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවන් නොලැබිණි.බොහෝ අවස්ථාවලදී අත්‍යාවශ්‍යම කාර්යයන් සිදු කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වූ අවස්ථාවල පවතින ප්‍රතිපාදනවලින් වැය මාරු කිරීම් සිදු කර එම කාර්යයන් සිදු කිරීමට කටයුතු කරන බව. | අයවැය ගත කාර්යයන් ළඟා කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |